# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1991 අංක 22 දරන
## ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක (අනුස්මරණ) ශිෂ්‍යත්ව භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 අප්‍රේල් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 අප්‍රේල් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1991 අංක 22 දරන ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක (අනුස්මරණ) ශිෂ්‍යත්ව භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1991 අප්‍රේල් මස 19 වන දින]

**එල්. ඩී.—ඔ. 5/89**

**ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක (අනුස්මරණ) ශිෂ්‍යත්ව භාරයේ භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අනුස්මරණ ශිෂ්‍යත්ව භාරයේ භාරකාර මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන භාරයක් ඒ භාරයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා මුදල් ප්‍රතිපාදනය කිරීම සඳහා මේ දක්වා පිහිටුවා ඇති බැවින් ද :

එම භාරයේ කටයුතු හා පරමාර්ථ භාරකාර මණ්ඩලයක් විසින් මේ දක්වා ඉටුකරනු ලැබ සහ ක්‍රියාත්මක කරනු ලැබ ඇති බැවින් ද :

එකී භාරකාර මණ්ඩලය සංස්ථාගත කරනු ලෙස එය විසින් ඉල්ලුම් කර ඇති බැවින් හා එකී ඉල්ලීම ඉටුකිරීම ඉන් ප්‍රතිලාභ ලබන ශිෂ්‍යයන්ගේ යහපත පිණිස හේතුවන බැවින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1991 අංක 22 දරන ඇස් ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක (අනුස්මරණ) ශිෂ්‍යත්ව භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක (අනුස්මරණ) ශිෂ්‍යත්ව භාරයේ භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට හා ඉන්පසු (මෙහි මින්මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක (අනුස්මරණ) ශිෂ්‍යත්ව භාරයේ භාරකාර මණ්ඩලයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙසින් පිහිටුවනු ලබන සංස්ථාවෙහි සාමාජිකයන් වශයෙන් මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක (අනුස්මරණ) ශිෂ්‍යත්ව භාරයේ භාරකාර මණ්ඩලය" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර, ඒ නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙසින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ආර්ථික හෝ මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ පා සිටින ශිෂ්‍යයන්ට උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ධෛර්ය දීම සහ උපකාර කිරීම සහ අඩු ආදායම් ලබන පවුල්වල ශිෂ්‍යයන්ට හෝ මව්පිය දෙදෙනාම නැතහොත් ඔවුන්ගෙන් එක් අයකු මියගොස් ඇති ශිෂ්‍යයන්ට හෝ එවැනි යම් අවාසිකර අවස්ථාවලට මුහුණ පා සිටින ශිෂ්‍යයන්ට උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ආධාර කිරීම සහ ක්‍රියාශීලී ලෙස ධෛර්ය දීම ;

(ආ) එවැනි තැනැත්තන්ට, අවශ්‍යතා උද්ගත වන ආකාරයට, ශිෂ්‍යත්ව ප්‍රදානයක් මත වර්ෂයකට තුන් වරක් හෝ සිවුවරක් මුදලින් ආධාර සැපයීම ;

(ඇ) ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ගේ සුභසාධනය සහ යහපත නංවාලීම පිණිස හැකි කවරදුවද ආකාරයකින් ආධාර දීම ;

(ඈ) විද්‍යා, වාණිජ, නීති, කෘෂිකර්ම, ඉංජිනේරු, වෛද්‍ය හා කලා ආදී විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ නිපුනතාවක් ඇතිකර ගැනීමට ශිෂ්‍යයන්ට ආධාර කිරීම ;

(ඉ) දේශමාමක විනිත ශිෂ්‍ය පරපුරක් ඇති කිරීමට පහසුකම් සැලසීම.

භාරකාර මණ්ඩලයේ සංයුතිය.

4. සංස්ථාවේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය, සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීති වලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන්නා වූ ද ඒ රීතිවලින් නියම කර ඇති සාමාජික යන් සංඛ්‍යාවකින් සමන්විත වන්නා වූ ද මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන භාරකාර මණ්ඩලය වෙත පැවරෙන්නේ ය.

මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

5. (1) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව සංස්ථාවේ නාමයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික හෝ සියලු දේවල් කිරීමේ බලය මණ්ඩලයට ඇත්තේ ය.

(2) (1) වන උප වගන්තියෙන් පවරා දී ඇති බලතලවල ව්‍යාප්ති යට හානියක් නොමැතිව මණ්ඩලය විසින් පහත සඳහන් බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම කරනු ලැබිය හැකිය :—

(අ) මේ පනත මගින් හෝ යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාග යක් හෝ පිරිනැමීමක් මගින් හෝ අන්‍යාකාර යෙන් සංස්ථාව වෙත පැවරෙන නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීම හා දැරීම ;

(ආ) එවැනි යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බදුදීම, ප්‍රදානය කිරීම, පවරාදීම, පිරිනැමීම, පැවරීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීම ;

(ඇ) සංස්ථාවට අයත් මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සුරැකුම්පත් වල ආයෝජනය කිරීම,

(ඈ) අරමුදලේ කාර්ය සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වා ගෙන යාම සහ වැසීම සහ සංස්ථාවේ දේපළ ඇපයට තබා හෝ ඇප නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඉ) අරමුදල් එකතු කිරීම සහ මුදලින් නැතහොත් පොත්පත් හා ද්‍රව්‍ය වලින් ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම ; සහ

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීමට ආනුෂංගික වන හෝ හිතකර වන අනෙකුත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

6. සංස්ථාවේ අරමුදල් පහත දැක්වෙන මුදල්වලින් සමන්විත වන්නේය :— සංස්ථාවේ අරමුදල්.

(අ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී භාරයේ බැරට තිබී එදිනෙන් පසු සංස්ථාව වෙත පැවරුණු සියලු මුදල් ; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් පසු සංස්ථාවට උපචිත වන්නා වූ ද එදින සිට සංස්ථාව වෙත පැවරෙන්නා වූ ද සියලු මුදල්.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි භාරයේ පැවති සියලු ණය සහ වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කරනු ලැබිය යුතු අතර, එදිනට භාරයට අයවිය යුතු සියලු ණය සහ දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය. අරමුදලට ගෙවිය යුතු සහ ලැබිය යුතු ණය.

8. සංස්ථාවේ මුද්‍රාව සභාපතිවරයා භාරයේ තිබිය යුතු අතර, සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි එය වෙනස් කරනු ලැබිය හැකිය. තවද මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී මිස මණ්ඩලයේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තවද ඒ සාමාජිකයන් දෙදෙනා පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි අත්සන් කළ යුතුය. සංස්ථාවේ මුද්‍රාව.

9. (1) මණ්ඩලය විසින් කලින් කළ මණ්ඩලයේ සාමාන්‍ය රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත සඳහන් කාරණා සියල්ලම සම්බන්ධයෙන් හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් සාදනු ලැබිය හැකිය :— සංස්ථාවේ රීති.

(අ) භාරකාර මණ්ඩලය පත්කිරීම හෝ තෝරා පත් කිරීම, මණ්ඩලයේ එක් එක් සාමාජිකයාගේ ධුර කාලය, රැස්වීම් කැඳවීම, පැවැත්වීම, රැස්වීම්වල දී කළ යුතු කටයුතු, රැස්වීම් පැවැත්විය යුතු කාලය, ස්ථානය, රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීමක ගණපූර්ණය සහ රැස්වීම් වල දී කළ යුතු කටයුතු ;

(ආ) ශිෂ්‍යත්ව ප්‍රදානය සහ 3 වන වගන්තියේ සඳහන් ශිෂ්‍යත්ව මුදල් ආධාර දීම ;

(ඇ) මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය ;

(ඈ) මණ්ඩලයේ සාමාජිකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් දරනු ලැබූ වියදම් පියවීම ;

(ඊ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම ;

(උ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම, එහි අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වා ගෙනයාම සහ ඒවා විගණනය කිරීම ;

(ඌ) ගිණුම් තැබීම, මුදල් තැන්පත් කිරීම සහ ලේඛනවල භාරකාරත්වය.

එවැනි රීති සාදනු ලැබීමෙන් පසු ඒවා එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට අළුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ සාමාජිකයෝ තත් කාලයේ සංස්ථාවේ බල පවත්නා රීති වලට යටත් විය යුත්තාහ.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන් සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.